# සාම්ප්‍රදායික ගොවිතැන හා බැඳි සාම්ප්‍රදායික ආරක්ෂණ ක්‍රමවේද (නල්ලමුදාව ග්‍රාමයේ සාම්ප්‍රදායික ගොවිතැන ඇසුරින්)


දේශානි එම්.කේ.එස්[1], හේරත් එම්.කේ.එස්[2] සහ පුෂ්පකුමාර ටී.එම්.එම්[3]

[1]අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
[2]පුරාවිද්‍යා අධ්‍යනාංශය, රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
[3]ඉංග්‍රිසි අධ්‍යනාංශය, රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
sandunideshani2000@gmail.com



**සාරසංක්ෂේපය**

දේශීය ගොවිතැනේ දී වගාව සරු කර ගැනිමට හා සතුන්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කරන ආරක්ෂණ ක්‍රම කෙතරම් දුරට ගොවිතැන හා බද්ධ වී තිබේද යන්න පර්යේෂණයේ අරමුණයි. සම්මුඛ සාකච්ඡා පර්යේෂණ ක්‍රමවේදයයි. සාම්ප්‍රදායික ගොවිතැන ආරම්භයට පෙර රාහු කාලය මඟහැර සියලු දෙවියන් සිහි කර වගා ආරම්භයෙන් වගාව උවදුරු වලින් ආරක්ෂා කර ගත හැකි බව විස්වාස කරයි. සුභ නැකතකට අනුව අල වර්ග සවස් කාලයේත් මල් හට ගන්නා බෝග උදෑසන කාලයේත් වගා කිරීමෙන් සතුන්ගෙන් වන හානිය අවම වෙයි. වී වගාවේදී කීඩෑවා නම් කෘමි උවදුර පාලනයට ජලය කපා දැමීම නම් ක්‍රමවේදය සම්ප්‍රදායික බෝග ආරක්ෂක ක්‍රමවේදයක් ලෙස යොදා ගනී. මීයන්ගෙන් අල වගාව, ගොයම් වගාවට වන හානිය වළවක්වා ගැනීමට වැටමාර ශාකයේ මල් හා අමු කොළ එකට දමා කොටා අමු ගොම හා ගව මූත්‍ර දමා සතියක් පල්කර සකසා ගත් දියරය කුඹුරේ ලියදිවලට යෙදීම සිදු කරයි. කෘමි උවදුර පාලනයට කුල්ලක ලාටු ගා වගාවේ පැළ අතර එහා මෙහා ගෙන යාම ද කැකුණ තෙල් තැවරූ පන්දම් වගා භූමියේ දැල්වීම ද සිදු කරයි. පළතුරු වගාවන්ට සත්ත්වයන්ගෙන් එල්ල වන බලපෑම් පාලනය කර ගැනීමට පෙරමෝන උගුල නම් වූ උපකරණ වගාවෙහි පිහිටු වීම, නියරවල් දිගට දාස්පෙතියා, සූරියකාන්ත, කපුරු ආදී ශාක සිටුවීම මඟින් කෘමි උවදුර මර්දනය කරගත හැකි බවට විස්වාස කරයි. පැඟිරි වර්ගයේ ශාක ශාකවල ඵලදාව අවම හෝ මුළුමනින් ම ඵලදාවෙන් තොර වූ විට ගසෙහි අතු කප්පාදු කිරීම හෝ ගසෙහි අතුවලට හානි කිරීම, ගසට හානි නොවන අයුරින් ගසෙහි මුල ගිනි දැල්වීම ද සිදු කරයි. අස්වැන්න ලබා ගැනීමෙන් පසු අනාගතය සඳහා සංරක්ෂණය කර ගැනීමට අටුවේ ගබඩා කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව සාම්ප්‍රදායික ගොවිතැනේ දී සාම්ප්‍රදායික ආරක්ෂණ ක්‍රමවේදයන් භාවිතයෙන් වර්තමානයේදී ද දේශිය කෘෂිකාර්මික කටයුතු සාර්ථක කර ගන්නා බව නිගමනය කළ හැකිය.



**ප්‍රමුඛ පදඃ** *ගොවිතැන, උවදුර, කෘමි, ශාක, අස්වැන්න, ආරක්ෂණ ක්‍රම*